**05-02-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, රාවණ් රාජ්‍යයෙන් ඔබව මුදාගෙන විමුක්තිය ලබා දීම සඳහා පරම පියා පැමිණ ඇත. අපායේ නිවැසියන් වන ඔබ දෙව්ලොව නිවැසියන් බවට හැරවීම සඳහා ඔහු පැමිණ ඇත.

**ප්‍රශ්නය:** භාරතයේ මිනිසුන් වන ඔබ දරුවන්ට කුමක් ගැන සිහි ගැන්වීම සඳහා පරම පියා පැමිණ ඇත්ද?

**පිළිතුර:** භාරතයේ මිනිසුන් වන දරුවනි, ඔබ දෙව්ලොව නිවැසියන්ව සිටියා. අවුරුදු 5000 කට ඉහත භාරතය දෙව්ලොව විය. දියමන්ති වලින් හා මැණික් එබ්බවූ මාලිගා එහි තිබුණි. ඔබ මුළු ලොවම හිමි කරුවන් විය. අහසත් පොළොවත් සියල්ල ඔබට අයිති විය. භාරතය වූ කලී, ශිව බාබා විසින් ස්ථාපනය කරන ලද ශිවාලයයි. පවිත්‍රතාවය එහි විය. එවැනි වූ භාරතයක් නැවතත් වාරයක් දැන් නිර්මාණය වීමට යයි.

**ගීතය:** ආදර දෙවියනි, අන්ධයින්ට මඟ පෙන්වා දෙන්න!

ඕම් ශාන්ති. ඔබ සුමිහිරි ආධ්‍යාත්මික දරුවන් වූ ජීවාත්ම සත්තාවන් ගීතය ඇසුවා. මෙය කීවේ කවුද? සියලු ජීවාත්ම සත්තාවන්ගේ ආධ්‍යාත්මික පියාය. ආධ්‍යාත්මික දරුවන් ආධ්‍යාත්මික පියාට මෙසේ කීවා ඕ බාබා! ඔහුට ඊශ්වර සේම පියා යැයි ද සඳහන්ය. කුමන පියාද? පියවරුන් දෙදෙනෙක් සිටින අතර, මේ පරම පියාය. ලෝකයේ ලෞකික කෙනා සහ ලෝකය අභිබැවූ කෙනාත් ය. ලෞකික පියාගේ දරුවන් මෙලොව අභිබැවූ පියාට මෙසේ අඬගසයි ඕ බාබා! අච්චා, බාබාගේ නම කුමක්ද? ශිවා. ඔහු අශරීරික වන අතර වන්දනාවට ලක් විය. ඔහුට පරම පියා යැයි කියැවේ. ලෞකික පියෙකුට පරම යැයි කිව නොහැකියි. සියලු ජීවාත්ම සත්තාවන්ගේ ඉහළම ඉහළ පියා එක්කෙනෙක් පමණි. සියලු මනුෂ්‍ය ජීවාත්ම සත්තාවන් එම එකම පියා සිහි කරයි. ජීවාත්ම සත්තාවන්ට ඔවුන්ගේ පියා අමතක වී ඇත. ඔවුන් මෙසේ අඬගසයි පරම පියා වන දෙවියනි! අපට අපගේ පියා හඳුනාගත හැකි වීමට අන්ධ අපට පෙනීම ලබා දෙන්න. භක්ති මාර්ගයේ අතපත ගෑමෙන් අපව නිදහස් කරන්න. ගැලවීම ලබා දීම සඳහා සහ ඔහු හමුවීම සඳහා මොවුන් පියාට අඬගසා තෙවැනි ඇස ඉල්ලා සිටී. මේ, හැම චක්‍රයකදීම පරමාත්ම පියා භාරතයට පැමිණ එහි දෙව්ලොව සාදන නිසාය. දැන් මේ කලි යුගයයි. මින් ඉක්බිතිව, ස්වර්ණමය යුගය ඒමට ඇත. මෙය වූ කලී පුරුෂෝත්තම සංගම යුගයයි. අසීමිත පරම පියා පැමිණ අපිරිසිදු වී දූෂණයට ලක් වූ අය ඉතාම උසස් අයවලුන් බවට පත් කරවයි. භාරතයේ ඉහළම අය වූයේ ඔවුන් (ලක්ෂ්මී සහ නාරායන) ය. එය ලක්ෂ්මී සහ නාරායන වංශයේ රජදහන වශයෙන් තිබුණි. මේ සියල්ල පිළිබඳ බාබා ඔබ දරුවන්ට සිහිගන්වයි. අවුරුදු 5000 කට ඉහත දී භාරතයේ මිනිසුන් දෙව්ලොව වැසියන් විය. ඒ සැමදෙන දැන් අපායේ වැසියන් වේ. අවුරුදු 5000 කට පෙර භාරතය දෙව්ලොව විය. භාරතයේ අතීතය පිළිබඳ බොහෝ පැසසුම් ඇත. දියමන්ති එබ්බවූ රන්වන් මාළිගා එහි තිබුණි. දැන් ඒ කිසිවක් නැත. එකල වෙනත් ආගම් නොතිබුණි. තිබුණේ සූර්ය වංශය පමණි. චන්ද්‍ර වංශය පවා පැමිණියේ පසු කලෙකය. පරම පියා මෙසේ විස්තර කරයි ඔබ සූර්ය වංශයට අයත්ව සිටියා. අද පවා, ඔවුන් ලක්ෂ්මී නාරායනට සිද්ධස්ථාන සාදයි. කොහොමනමුත්, කිසිවෙක් දැන සිටියේ නැහැ කවදා ලක්ෂ්මී නාරායන රජදහන තිබුණේද හෝ එය කෙසේ ලබා ගත්තේද කියා. දිගටම ඔවුන්ට වන්දනාමාන කළත් කිසිවෙක් කිසිවක් දැන සිටියේ නැත. ඒ නිසා, එය වූ කලී අන්ධ විශ්වාසයයි. ඔවුන් ශිවා සහ ලක්ෂ්මී සහ නාරායන ද වන්දනාමාන කරන නමුත් ඔවුන් කිසිවෙකුගේ චරිතාපදාන නොදනී. භාරතයේ මිනිසුන් දැන් මෙසේ කියයි අප අපවිත්‍රයි! බාබා, අපිරිසිඳු අප පිරිසිඳු කරන කෙනා වන බාබා, එන්න! පැමිණ අපව රාවණ් රජ දහනෙන් සහ දුකින් මුදවා ගන්න! පරම පියා පමණක් පැමිණ හැම කෙනෙක්ම මුදවා ගනී. ඔබ දරුවන් දන්නවා ඇත්තෙන්ම ස්වර්ණමය යුගයේ තිබුණේ එකම රජ දහනක් බව. බාපුජී ගාන්ධි පවා කිව්වේ ඔහුට අවශ්‍ය රාම රාජ්‍යය කියාය. ගෘහස්ථ ආගම අපිරිසිඳු බවින් පිරිසිඳු බවට පත් විය යුතුය. අපට දෙව්ලොව නිවැසියන් බවට පත් වීම අවශ්‍යය. ඔබට දැකිය හැකියි අපායේ නිවැසියන් දැන් පත්වී ඇති තත්ත්වය. මෙය හඳුන්වනුයේ අපාය හෙවත් යක්ෂ ලෝකය කියාය. අතීත භාරතය දෙවි දේවතාවුන්ගේ ලෝකය විය. පියා මෙහි සිට විස්තර කරනවා ඔබ උපත් මිලියන 8.4 ක් නොව උපත් 84 ක් ගෙන ඇති බව. පරම පියා මෙසේ විස්තර කරයි මුලින් ඔබ සාම දේශයේ නිවැසියන් විය. ඔබ මෙහි ආවේ ඔබේ චරිත කොටස් ඉටු කිරීමටයි. ඔබ උපත් 84 ක

කොටස් රඟපා ඇත. ඔබ නියතයෙන්ම නැවත උපදී. නැවත උපත් 84 ක් ඇත. අසීමිත පරම පියා දැන් පැමිණ ඔබ දරුවන්ට ඔබේ අසීමිත උරුමය ලබා දෙයි. පරම පියා අමතන්නේ ඔබ දරුවන්ටය, ඔබ ජීවාත්ම සත්තාවන්ටය. අනෙකුත් ආධ්‍යාත්මික කණ්ඩායම් වලදී, මිනිසුන් මිනිසුන්ටම භක්ති මාර්ගයේ විවිධ දේ කියයි. භාරතය දෙව්ලොව ලෙස තිබූ චක්‍ර භාගයෙහිම, එකම අපවිත්‍ර කෙනෙක්වත් සිටියේ නැත. මෙකල, මෙහි එකම පවිත්‍ර කෙනෙක්වත් නැත. මෙය වූ කලී අපවිත්‍ර ලෝකයයි. ගීතාවේ ලියා ඇත්තේ ක්‍රිෂ්ණා දෙවියන් කතා කරයි කියා වුවත්, ඔහු ගීතාව කියා දුන්නේ නැත. ඔවුන් ඔවුන්ගේම ආගමේ ලේඛණය ගැනවත් නොදනී. ප්‍රධාන ආගම් හතරක් ඇත. පළමු වැන්න, ආදී සනාතන දේව් දේවතා ධර්මයයි. සූර්ය වංශය සහ චන්ද්‍ර වංශය එකට ගෙන දේව් දේවතා ධර්මය යැයි කියයි. එහි දුක ගැන සඳහනක් හෝ නැත. ඔබ උපත් 21 ක්ම සතුටු දේශයේ සිටියා. ඉන්පසු, භක්ති මාර්ගය වන රාවණ් රාජ්‍යය ආරම්භ විය. භක්ති මාර්ගය ඔබේ පිරිහීම සඳහාය. භක්තිය රාත්‍රිය වන අතර ඥානය දහවල්ය. දැන් ඝණ අන්ධකාර රාත්‍රියයි. දේදුනු දෙකක් ඇත. ශිව ජයන්ති (ශිවාගේ උපන් දිනය) සහ ශිව රාත්‍රිය (ශිවාගේ රාත්‍රිය). ශිව බාබා පැමිණියේ කවදාද? කොයි වේලාවේද? රාත්‍රී කාලයේය. පරම පියා පැමිණෙන්නේ භාරතයේ මිනිසුන් ඝණ අන්ධකාරයේ සිටින විටයි. ඔවුන් දිගටම කිසිවෙකුගේ චරිතාපදානය නොදැන බෝනික්කන්ට සේ දිගටම වන්දනා කරයි. භක්ති මාර්ගයේ පොත් නිමැවීමට නියමිතයි. මේ නාටකය සහ ලෝක චක්‍රය තේරුම් ගත යුතු දෙයකි. මෙම ඥානය ආගමික ලේඛන තුළ නැත. එය භක්ති දැනුම හෙවත් දර්ශනයයි. එම ඥානය විමුක්ති මාර්ගය සඳහා නම් නොවේ. පරම පියා මෙසේ කියයි මම පැමිණ බ්‍රහ්මා තුළින් ඔබට සැබෑ ඥානය කියා දෙමි. මිනිසුන් මෙසේ හඬගායි අපට සතුට හා සාමයේ දේශය කරා මඟ පෙන්වන්න. පරම පියා මෙසේ කියයි අවුරුදු 5000 කට පෙර ඔබ මුළු ලොව දෙව්ලොව ලෙස පාලනය කළා. ඒ සූර්ය වංශික රජ දහන ලෙස තිබෙන කළ අන් සියලු ජීවාත්ම සත්තාවන් සිටියේ සාම දේශයේය. 9,00,000 ක් මෙහිදී සිහිපත් වේ. අවුරුදු 5000 කට පෙර දරුවන් ඉතා ධනවත් වුණා. ඔබට බොහෝ ධනය ලැබුණා. ඔබ ඒ සියල්ලෙන් කුමක් කළාද? ඔබ එතරම්ම ධනවත්ව සිටියා! භාරතය ඉහළම දේශය වුණා. එය පවිත්‍රතාව ඇති කරන පරම පියාගේ උපන් ස්ථානය නිසා සියලු දෙනාගේ වන්දනීය ස්ථානය වුණා. සියලු ආගම් වල මිනිසුන්ට පරම පියා පැමිණ ගැලවීම ලබා දුන්නා. දැන් ලංකා පමණක් නොව මුළු ලොව පුරාම ඇත්තේ රාවණ් රාජ්‍යයයි. හැම කෙනෙක් තුළම පාප පහ ඇත. සූර්ය වංශික රජ දහන තිබුණු කළ පාප නොතිබුණි. එවිට භාරතය පාපයෙන් තොර විය. දැන් එය පාපකාරීය. එකල ස්වර්ණමය යුගයේ දෙව් දේවතා ප්‍රජාව සිටියා. ඔවුන් උපත් 84 ක් ගත් අතර දැන් යක්ෂ ප්‍රජාව බවට පත් වෙලා. ඔවුන් නැවත දෙව් දේවතා ප්‍රජාව බවට පත් විය යුතුයි. භාරතය බොහෝ ධනවත්ව තිබුණා. එය දැන් ණය ඉල්ලන්නේ ඉතා දුප්පත් වී ඇති හෙයිනි. පරම පියා මෙසේ කියයි ඔබ ඉතා ධනවත්ව සිටියා! ඔබට ලැබුණු සතුට වෙන කිසිවෙකුට ලැබුණේ නැහැ. ඔබ මුළු ලොවම හිමිකරුවන් වී සිටියා. අහසත් පොළොවත් සියල්ල ඔබට අයිති ව තිබුණා. පරම පියා ඔබට සිහිපත් කරනවා භාරතය ශිව බාබා විසින් ස්ථාපිත කරන ලද ශිවාලය වූ බව. ඒ පවිත්‍රතාව තිබුණු අතර එම නව ලෝකය පාලනය කළේ දේව් දේවතාවුන්ය. භාරතයේ මිනිසුන් දැන සිටියේ නැහැ රාධේ සහ ක්‍රිෂ්ණා අතර නෑ කමක්. එකිනෙකා අයත් වූයේ වෙනස් රජදහන් වලටය. ඉන්පසු විවාහයේ දී ඔවුන් ලක්ෂ්මි නාරායන බවට පත් වුණා. කිසිම මනුෂ්‍යයෙකුට මෙම ඥානය නැහැ. ඥාන සාගරය වන පරම පිතා පරමාත්මාට පමණයි එය ඇත්තේ. ඔහු මේ ආධ්‍යාත්මික ඥානය ඔබට දෙනවා. පරම පියාට පමණයි ආධ්‍යාත්මික ඥානය දිය හැක්කේ. පියා දැන් මෙසේ කියයි ජීව සත්තාමය විඥානයට පැමිණෙන්න. පරම පිතා පරමාත්මා, ශිවා වන මා සිහිකරන්න! ඔබට සතෝප්‍රධාන් බවට පත් විය හැක්කේ මෙම සිහිකිරීම තුළින් පමණි. ඔබ මෙහි පැමිණෙන්නේ මනුෂ්‍ය බවේ සිට දෙව් දේවතාවුන් බවට වෙනස් වීමටයි. එනම්, අපවිත්‍ර බවේ සිට පිරිසිදු බවට පත් වීමටයි. දැන් ඇත්තේ රාවණ් රාජ්‍යයයි. භක්ති මාර්ගයේ දී රාවණ් රාජ්‍යය ආරම්භ වේ. රාවණ් පැහැර ගත්තේ එක සීතාවක් පමණක් නොවේ. භක්තිය සිදු කරන සියලු දෙනාම රාවණ්ගේ නියපොතු වලට අසු වී ඇත. මුළු ලොවම පාප පහ නම් වූ රාවණ්ගේ සිර මැදිරිය තුළට හසු වී ඇත. හැම කෙනාම දැන් දුක් ලෝකය තුළ දුක අත්විඳියි. පරම පියා පැමිණ සෑම දෙනාම මුදා ගත්තා. පරම පියා නැවතත් වරක් දෙව්ලොව සාදමින් සිටී. ධනය බොහෝ ඇති අය දිව්‍ය ලෝකයේ සිටින බව නොවේ. නැත මෙය දැන් අපායයි! සියලු දෙනා අපවිත්‍ර වන අතර ඔවුන් ගංගා නම් ගඟට නෑමට යන්නේ එහෙයිනි. ඔවුන් විශ්වාස කරන්නේ ගංගා නම් ගඟ පාරිශුද්ධකරුවාණන් කියාය. කොහොමනමුත්, එසේ පවිත්‍ර වන්නේ නැත. පවිත්‍රකරුවාණන් ලෙස කිව හැක්කේ පරම පියාණන්ට මිස ගංගා වලට නොවේ. ඒ සියල්ල අයත් වන්නේ භක්ති මාර්ගයටය. මේ සියල්ල විස්තර කරන්නේ තම පියා පරම පියා විසිනි. ඔබ දැන් දන්නවා කෙනෙක් ලෞකික පියා ද අනෙකා සූක්ෂම පියා වන ප්‍රජාපිතා බ්‍රහ්මා වන අතර ලෝකය අභිබැවූ පරම පියා ද ඇති බව. පියවරුන් තිදෙනෙකි. ශිව පියා බ්‍රාහ්මණ ආගම ප්‍රජාපිතා බ්‍රහ්මා තුළින් ගොඩනඟයි.

බ්‍රහ්මින්වරුන්ට රාජයෝගා උගන්වන්නේ දේවි දේවතාවරුන් බවට පත් වීම සඳහාය. පරම පියා එකවර පමණක් පැමිණ ජීවාත්ම සත්තාවන්ට රාජයෝගා උගන්වයි. ජීවාත්ම සත්තාවන් නැවත නැවත උපදියි. ජීවාත්ම සත්තාව මෙසේ කියයි මා මගේ ශරීරය අතහැර වෙන ශරීරයක් ගනී. පරම පියා මෙසේ කියයි ඔබ ජීවාත්ම සත්තාවක් බව සලකා, පරමාත්ම පියා වන මා සිහිකළ විට පිරිසිදු බවට පත් වේ. කිසිඳු ශාරීරික කෙනෙක් සිහි නොකරන්න. දැන් මේ ඇත්තේ මරණයේ දේශයේ අවසානයය. අමරණීයත්වයේ දේශය ඉදිවෙමින් පවතී. අනෙකුත් නොගිනිය හැකි සියලු ආගම් විනාශ වෙයි. ස්වර්ණමය යුගයේ දී ඇත්තේ එකම දේව ආගම පමණි. ඉන්පසු ත්‍රේත යුගයේ දී චන්ද්‍ර වංශය ඇත, රාමා සහ සීතාය. බාබා ඔබ දරුවන්ට මුළු ලෝක චක්‍රය සිහිගන්වයි. සාමය හා සතුටේ දේශය ගොඩනඟන්නේ පරම පියා පමණි. මනුෂ්‍යායින්ට මනුෂ්‍යායින් සඳහා ගැලවීම ලබා දිය නොහැකිය. ඒ සියලු දෙනා භක්ති මාර්ගයේ ගුරුන්ය. භක්ති මාර්ගයේ දී මිනිසුන් බොහෝ ප්‍රතිමා අඹා වන්දනා කර අනතුරුව ගොස් මෙසේ කියයි ගිලෙන්න, ගිලෙන්න! ඔවුන් බොහෝ සෙයින් ප්‍රතිමා වන්දනා කර ඒවාට ආහාර පවා පිළිගන්වයි. කොහොමනමුත්, ඒවා අනුභව කරන්නේ බ්‍රාහ්මණ පූජකවරුන්ය. එයට බෝනික්කන් වන්දනාව යැයි කියයි. ඒ තරම්ම අන්ධ විශ්වාස ඇත! දැන්, ඔවුන්ට මෙය විස්තර කර දෙන්නේ කවුද? පරම පියා මෙසේ කියයි ඔබ දැන් දේව දරුවන්ය. පරම පියාගෙන් රාජයෝගා ඉගෙනිමින් සිටී. රජ දහන ස්ථාපනය වෙමින් තිබේ. බොහෝ යටත් වැසියන්ද නිර්මාණ කළ යුතුව ඇත. සුළු පිරිසෙනුත් ඉතා අතලොස්සක් රජවරුන් වෙයි. ස්වර්ණමය යුගයට මල් වත්තක් යැයි ද කියැවේ. බ්‍රහ්මින් වරු වන ඔබ පමණයි මෙම ඥානය ලබන්නේ. ලක්ෂ්මී නාරායනටද මෙම ඥානය නැත. දැන් මෙය කටු අකුලකි. රාවණ් රාජ්‍යය වෙනස් වෙමින් ඇත. විනාශය සිදුවිය යුතුමය. පසුව මෙම ඥානය අතුරුදන් වේ. භක්ති මාර්ගයේ කිසිවෙක් පරම පියාව නොහඳුනයි. නිර්මාණකරුවා වන්නේ පරම පියා පමණි. බ්‍රහ්මා, විශ්ණු සහ ශංකර් ද නිර්මාණම වෙයි. දෙවියන් සර්ව ව්‍යාපී යැයි කියූ විට හැම කෙනෙක්ම පියා බවට පත්වෙයි. එනයින්, උරුමයට ඇති අයිතිය වැලකෙයි. පරම පියා පැමිණ ඔබ දරුවන් සියලු දෙනාටම උරුමය ලබා දෙයි. ගැලවුම් කරුවාණන් වන්නේ පරම පියා පමණි. උපත් 84ක් ගන්නා අය පමණි, ස්වර්ණමය යුගයට මුලින්ම එන්නේ යනුවෙන් විස්තර වෙයි. ක්‍රිස්තියානිවරුන් උපත් කීයක් ගන්නවාද? සමහර අය උපත් 40 ක් පමණ ගනී. මේ ගණන් සෑදීම කළ හැකියි. ඒකායන දෙවියන් සොයමින් මිනිසුන් හැම තැනම යති. ඔබ තව දුරටත් එසේ කළ යුතු නැත. ඔබ කළ යුත්තේ පරම පියා සිහිකිරීම පමණි. මේ වූ කලී ස්මෘති වන්දනාවයි. මේ පාරිශුද්ධකරුවාණන් ගේ දෙව් පිය විශ්ව විද්‍යාලය වේ. ඔබ ජීවාත්ම සත්තාවන් එහි ඉගෙන ගනිමින් සිටී. මුණිවරුන් සහ ශුද්ධවන්තයින් කියන්නේ ජීවාත්ම සත්තාවන්ට කර්ම ඵලයෙන් බලපෑමක් නොවන බවය. ඔවුන්ගේ ක්‍රියා වලට අනුරූපව නැවත උපදින්නේ ජීවාත්ම සත්තාවන්ය. හොඳ හෝ නරක ක්‍රියා කරන්නේ ජීවාත්ම සත්තාවන්ය. මෙකළ, ඔබේ ක්‍රියා පාපකාරී බවට පත් වී ඇත. ස්වර්ණමය යුගයේ දී ක්‍රියා අකර්ම නම් වේ. එහි පාපකාරීත්වයක් නැත. එය වූ කලී පුණ්‍යවන්ත ජීවාත්ම සත්තාවන්ගේ ලෝකයයි. මෙම සියලු කරුණු අවබෝධකරගෙන විස්තර කර දිය යුතුව ඇත. අච්චා.

කටු මල් බවට වෙනස් කිරීමේ, උත්සාහයට අනුව අංක පිළිවෙලින් වන සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. කටු මල් බවට වෙනස් කිරීමේ සේවය සහ මල් වත්ත, ස්වර්ණමය යුගය ස්ථාපනය කිරීමේ සේවය කරන්න. කිසිඳු නරක ක්‍රියාවක් නොකරන්න.
2. පරම පියා ඔබට ලබා දෙන ආධ්‍යාත්මික ඥානය හැම කෙනෙකුටම කියා දෙන්න. ජීව සත්ථාමය විඥානයෙන් සිටීමට උත්සාහ කරන්න. කිසිඳු ශාරීරික කෙනෙක් නොව පරම පියා පමණක් සිහියේ තබා ගන්න.

**වරදානය:** ප්‍රශංසාවේදීත්, අපහාසයේදීත්, ජයග්‍රහණයේදීත්, පරාජයේදීත් ඔබ එකම අවධිය පවත්වා ගෙන, පරම පියාට සමානව සම්පූර්ණ හා පරිපූර්ණ බවට පත්වේවා.

ජීවාත්මයක් පරිපූර්ණ සහ පරිසමාප්ත අවධියට ළඟා වූ විට, ඔහු ප්‍රශංසාවේ දී සහ අපහාසයේ දී, ජයග්‍රහණයේ දී සහ පරාජයේ දී සහ සතුටේ දී සහ දුකේ දී සමානාත්මතාවය පවත්වා ගනී. දුක මධ්‍යයේ වුවද, ඔබේ මුහුණේ හෝ නළලේ දුක්බර රැළි තිබීම වෙනුවට, සතුටේ සහ

ප්‍රීතියේ රළ දැශ්‍යමාන වේවා. ඕනෑම අපහාසයක් ඇසෙන විට පවා, එය අපහාසයක් ලෙස නොසිතන්න, නමුත් ඔබේ පරිසමාප්ත අවධියේදී ඔබව පරිණත කිරීමට එන ප්‍රශංසනීය වදන් වේ. ඔබට එවැනි සමානාත්මතාවයක් ඇති විට, ඔබ පරම පියාට සමාන යැයි කියනු ලැබේ. යමෙකු සතුරෙකු වී ඔබට අපහාස කිරීමට පැමිණෙන අතර තවත් අයෙකු ඔබට ප්‍රශංසා කිරීමට පැමිණෙන බවට සුළු ආකල්පයක්වත් තබා නොගන්න.

**පාඨය:** යෝගාවේ සිටීමට නිරන්තරයෙන් අවධානය යොමු කරන්න, එවිට ඔබ පළමු කොටසේ අංකයක් ලබා ගනු ඇත.

***** ඕම ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: එකමුතුකම සහ විශ්වාසයේ විශේෂත්වයෙන් සාර්ථකත්වයෙන් පිරිපුන් වන්න.**

බොහෝ බ්‍රහ්මණයන් සිටියත්, බ්‍රහ්මණ පවුලේ විශේෂත්වය වන්නේ එක්සත් වීමයි. කම්පන සෑම කෙනෙකුටම දැනෙන්නට ඉඩ හරින්න. ඔබ බොහෝ දෙනෙක් සිටියත්, ඔබ සියල්ලෝම එක්සත් ය. ඔබේ එකමුතුකමේ කම්පන මුළු ලෝකය පුරාම එක් ධර්මයක් සහ එක් රාජධානියක් ස්ථාපිත කරනු ඇත. එබැවින්, ඕනෑම විවිධත්වයක් අවසන් කර සෑම විටම සමගිය ඇති කිරීමට විශේෂ අවධානයක් යොමු කරන්න.